# ඉස්ලාමයේ මූලික ප්‍රතිපත්තිය

التوحيد

Moulaviya M.Y.Maziyya B.A. (Hons)

**තව්හීද් (ඒකදේවත්වය)**

ඒකදේවත්වය යනුනේ, අල්ලාහ්ට හිමිවන හා ඔහුට වැඳුම් පිදුම් කිරීමට අනිවාර්ය කළ සෑම දේ මගින් ඔහු ඒකත්වය කිරීමයි. මේ පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

وَمَا خَلَقْتُ الْجِنَّ وَالْإِنسَ إِلَّا لِيَعْبُدُونِ

තවද, පින් හා මිනිස් වර්ගයන් මාහට ඉබාදත් (සම්පූර්ණයෙන් අවනතවී මාගේ අණ පිළිගෙන ජීවත්වීමට හා මාහට පමණක් වැඳුම් පිදුම්) කිරීමට හැර මා මැවුයේ නැත. (අල්කුර්ආන් 51: 56)

وَاعْبُدُواْ اللّهَ وَلاَ تُشْرِكُواْ بِهِ شَيْئًا

තවද, අල්ලාහ් තආලාට (පමණක්) වැඳුම් පිදුම් කරන්න. තවද, ඔහුට කිසිවක් සමාන නොකරන්න. (අල්කුර්ආන් 4: 36)

තව්හීද් (ඒකදේවත්වය) කොටස් තුනකි. ඒවා තව්හීදුල් රුබූබියියා, තව්හීදුල් උලූහියියා හා තව්හීද් අස්මා වස්සිෆාත් යනාදියන්ය.

1. **තව්හීදුල් රුබූබියියා**

එය මවනු ලැබූ දෙයින්ද, විශ්වය පරිපාලනය කිරීමේ තුළින්ද අල්ලාහ්ව ඒකත්ව කිරීමයි. ඔහු ආහාර සපයන්නාය. ජීවන කරන්නාය. විනාශ කරන්නාය. අහසෙහි හා පොළොවෙහි පාලනය ඔහු සතුය. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

هَلْ مِنْ خَالِقٍ غَيْرُ اللَّهِ يَرْزُقُكُم مِّنَ السَّمَاءِ وَالْأَرْضِ لَا إِلَهَ إِلَّا هُوَ

අල්ලාහ් හැර වෙනත් මැවුම්කරුවෙකු සිටින්නේද? ඔහු ඔබට අහසෙන් හා පොළොවෙන් ආහාර ලබා දෙන්නේය. ඔහු හැර (වැඳුම් පිදුම් කිරීමට සුදුස්සාවූ)

දෙවි කෙනෙකු නොමැත. (අල්කුර්ආන් 35: 3)

تَبَارَكَ الَّذِي بِيَدِهِ الْمُلْكُ وَهُوَ عَلَى كُلِّ شَيْءٍ قَدِيرٌ

කවරෙකුගේ අනෙහි රජකම (සර්ව පාලනය) තිබෙන්නේද? ඔහු ශ්රේෂ්ඨවන්තයාය. ඔහු සෑම දේ කෙරෙහි ශක්ති වන්තයාය. (අල්කුර්ආන් 67: 1) විශ්වයේ සැමහි ආධිපත්යයා අල්ලාහ් තආලාය. ඔහුගේ නිගමනය පරිදි එය පවතින්නේය. පාලනය කිරීමෙන් අල්ලාහ්ව ඒකත්වය කිරීමෙන් හැඳින්වන්නේ, ඔහු සියලු මැවිල්යන් පාලනය කිරීමයි. අල්ලාහ් මෙසේ පවසයි.

أَلاَ لَهُ الْخَلْقُ وَالأَمْرُ تَبَارَكَ اللّهُ رَبُّ الْعَالَمِينَ

දැනගන්න මැවීමද පාලනය පාලනය කිරීමද ඔහු සතුය. අල්ලාහ් ඉමහත් ශ්රේෂ්ඨවන්තයාය. ලොව වැසියන්ගේ පෝෂකයාය. (අල්කුර්ආන් 7: 54) මෙහි සියලු මැවීම් පාලනය කිරීමද අඩංගුවේ. මිනිසුන්ගෙන් සුළු පිරිසක් මෙම කොටස ප්රතික්ෂේප කරති. ඔවුහුද තම හෘදයන් මෙය තහවුරු කරන අතර, ප්රසිද්ධියෙන් (පමණක්) ප්රතික්ෂේප කරති. මේ බව අල්ලාහ් මෙසේ පවසයි.

وَجَحَدُوا بِهَا وَاسْتَيْقَنَتْهَا أَنفُسُهُمْ

තවද, ඔවුන්ගේ හෘදයන් එය (සත්ය බවට) ස්ථිර කළේද, ඔවුහු ඒවා ප්රතික්ෂේප කළහ. (අල්කුර්ආන් 27: 14)

## 2. තව්හීදුල් උලූහියියා

තව්හීදුල් උලූහියියා යනුවෙන් හැඳින්වන්නේ, සියලු වැඳුම් පිදුම්වලින් අල්ලාහ්ව ඒකත්ව කිරීමයි. මිනිසෙකු අල්ලාහ් සමඟ වැඳුම් පිදුම් කිරීමට හා ලඟාවීමට අන් කිසිවෙකු තෝරා නොගත යුතුයි. අල්ලාහ් පවසන පරිදි මෙම කොටසෙහි තේරුම, ‘අල්ලාහ් තආලා මැවීම් සියල්ල මැව්වේ ඔහු(ට අවනතවීම) සඳහාය’ යන්නේය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

وَمَا خَلَقْتُ الْجِنَّ وَالْإِنسَ إِلَّا لِيَعْبُدُونِ

මිනිස් හා ජින් වර්ගයන් මාහට ඉබාදත් (සම්පූර්ණයෙන් අවනතවී මාගේ අණ පිළිගෙන ජීවත්වීමට හා වැඳුම් පිදුම්) කිරීමට හැර, මා මැවුවේ නැත. (අල්කුර්ආන් 51: 56) ඔහු දූතයන් එව්වේද, දේව ග්රන්ථ පහළ කළේද මෙම තව්හීදය කරාය. අල්ලාහ් මේ පිළිබඳව මෙසේ පවසන්නේය.

وَمَا أَرْسَلْنَا مِن قَبْلِكَ مِن رَّسُولٍ إِلَّا نُوحِي إِلَيْهِ أَنَّهُ لَا إِلَٰهَ إِلَّا أَنَا فَاعْبُدُونِ

(නබිතුමනී) නිශ්චයෙන්ම, (වැඳුම්, පිඳුම් කිරීමට අයත්) දෙවියා මා හැර අන් කිසිවෙකු නොමැත. එනිසා මාහටම වැඳුම් පිඳුම් කරන්න නම්වූ නියෝගය (වහී) පහළ නොකර කිසියම් රසූල් (දූත) වරුන් අපි ඔබට පෙර නොඑව්වෙමු. (අල්කුර්ආන් 21: 25) තව්හීදයේ මෙම කොටස, දූතයන් තම සමාජයන් කැඳවූ අවස්ථාවන්හිදී මුෂ්රික්වරුන් (අල්ලාහ්ට හවුල් කරන්නන්) ප්රතික්ෂේප කළ කොටසෙකි. අල්ලාහ් මේ පිළිබඳව මෙලෙස පවසන්නනේය.

قَالُواْ أَجِئْتَنَا لِنَعْبُدَ اللّهَ وَحْدَهُ وَنَذَرَ مَا كَانَ يَعْبُدُ آبَاؤُنَا

එයට අප මුතුන් මිත්තන් ඇදහීම් කළ දෙවිවරුන් අතහැර, අල්ලාහ් පමණක් ඇදහීම සඳහාද අප වෙත පැමිණ (කැඳවා) සිටින්නේ? යනුවෙන් ඔවුන් ඇසීහ. (අල්කුර්ආන් 07: 70)

මෙම කාරණාවන් අනුව කිසියම් වැඳුම් පිඳුම් වර්ගයන් අල්ලාහ් හැර අන් කිසිවෙකුටද, සමීපවූ මක්වරුන්ටද, ආගම් පහළවූ රසූල්වරුන්ටද, යහපත් වලීවරුන්ටද (දේව ගැත්තන්) හා අන්කිසි මැවීම්වලටද යොමුකිරීම වලංගු නොවන්නේය. කුමක් නිසාදයත්, වැඳුම් පිඳුම් සියල්ල කළ යුත්තේ අල්ලාහ්ට පමණි.

### 3. තව්හීදුල් අස්මා වස්සිපාත්

මෙය අල්ලාහ් තමාට නම් (අස්මා) කළ හෝ ලක්ෂණ (සිෆාත්) කළ හෝ නබි මුහම්මද් (සල්) තුමා අල්ලාහ් ගැන නම් කළ හෝ ලක්ෂණ කළ දේ මගින් විශ්වාසය කිරීම හා එම විශ්වාසය කිසියම් වෙනස් කිරීම්, වසංකිරීම්, ප්රමාණ කිරීම් හා උදාහරණ කිරීමෙන් තොරව ඔහුගේ මහිමයට ඔබ්න පරිදී පිළිපැදීමකි. යථාර්ථයෙන් අල්ලාහ් තමා ගැන නම්කළ දේ විශ්වාස කිරීම සියලු දෙනාටම අනිවාර්යවේ.

උදාහරණයක්නම්, අල්ලාහ් තමාව 'හයියුල් කෙයූම්' (නිත්ය ජීවමානයි) යනුවෙන් නම් කරයි. මෙහිදී 'හයියු' යනුවෙන් හැඳින්වෙන්නේ ඔහුගේ නම්වලින් (අස්මාවෙන්) එකක් බවත්, මෙම නාමය විනාශයෙන් තොර සම්පූර්ණ ජීවිතයක් (හයාත්) වර්ණනාවන ඔහුගේ ලක්ෂණවලින් (සිෆාත්) එකක් බවත්, තවද, අල්ලාහ් තමාව සමීඋන් (අසන්නාය) යනුවෙන් නම් කරයි. එය ඔහුගේ නම්වලින් (අස්මා) එකක් බවත්, එය ඇසීම (සම්උ) වර්ණනාවන ඔහුගේ ලක්ෂණවලින් (සිෆාත්) එකක් බවත් විශ්වාස කිරීම අනිවාර්යවේ. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

وَقَالَتِ الْيَهُودُ يَدُ اللّهِ مَغْلُولَةٌ غُلَّتْ أَيْدِيهِمْ وَلُعِنُواْ بِمَا قَالُواْ بَلْ يَدَاهُ مَبْسُوطَتَانِ يُنفِقُ كَيْفَ يَشَاءُ

අල්ලාහ්ගේ අත වසා ඇති බව යුදෙව්වරුන් පවසති. වසා තිබෙන්නේ ඔවුන්ගේ අත්ය. මෙසේ කීමෙන් ඔවුහු ශාපයට ලක්වූහ. නමුත් අල්ලාහ්ගේ දෑත් විවෘතව පවතී. ඔහු සිය හිතුමතය පරිදි විසඳම් කරයි. (අල්කුර්ආන් 5: 64)

අල්ලාහ් තමාට විශාල වශයෙන් දානය කිරීමේ දෑත් තිබෙන බව පවසයි. එනිසා ඔහුට දානයෙන් හා ප්‍රධානයෙන් යුත් විවෘත දෑත් තිබෙන බව විශ්වාස කළ යුතුයි. නමුත් මෙම දෑත් ගැන සිතින් රූපනය කිරීමෙන්ද, මුවින් ප්‍රමාණ කිරීමෙන්ද, මවනලද දෑත්වලට උදාහරණ කිරීමෙන්ද වැළකී සිටිය යුතුයි. කුමක්නිසාදයත්, අල්ලාහ් මෙසේ පවසන්නේය.

لَيْسَ كَمِثْلِهِ شَيْءٌ وَهُوَ السَّمِيعُ البَصِيرُ

ඔහු හා සමාන කිසියම් දෙයක් නොමැත. තවද, ඔහු (සෑමදේ) ශ්‍රවණය කරන්නාය. නෙත් යොමා සිටින්නාය. (අල්කුර්ආන් 42: 11) තව්හීදයෙහි මෙම කොටසේ සාරාංශය වන්නේ අල්ලාහ් හෝ නබිතුමා නියම කළ අල්ලාහ්ගේ අස්මා (නම්) හා සිෆාත් (ලක්ෂණ) යථාර්තයෙන් කිසියම් වෙනස් කිරීම්, උදාහරණ කිරීම්, ප්‍රමාණ කිරීම් හා වසංකිරීමකින් තොරව ක්‍රියා කිරීමකි.